# උද්‍යානයේ කුඩා තරුව ලිලී



W.M. සෙනුලි ගෙහන්සා වීරසිංහ

# උද්‍යානයේ කුඩා තරුව

# ලිලී

## සෙනුලි ගෙහන්සා වීරසිංහ

කතෘ

කතෘගේ වෙනත් කෘති :

- මලිඳුට පාඩමක්
- අපූරු මිතුදම
- ලස්සන පවුලක්
- පුංචි සුරංගනාවී
- **Greed costs Malidu**

| | | |
|---|---|---|
| පාසල | : | මහ/මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පන්තිය | : | 6 ශ්‍රේණිය |
| කෘතිය එළ කරන දිනය | : | 2026.05.10 |
| ISBN අංකය | : | **978-624-211-299-2** |

# පිදුම

මගේ ජීවිතේ ආලෝකය දුන්න,

මගේ පළමු ගුරුවරුන් වූ,

මට ආදරය, විශ්වාසය, ලියන්නට දේවල් ඉගැන්වූ

ආදරණීය **අප්පච්චිට, අම්මාට,**

මගේ හිනාවට, කඳුළට, සෙල්ලම් වලට,

සහ මගේ කතා වලට මුල්ම අහන්නන් වූ

ආදරණීය **සහෝදරයාට, අත්තාට, අත්තම්මාට**

අකුරු කියවන්න, වචන ගොතන්න, සිහින දකින්න උගන්වපු,

මගේ දෙවන දෙමාපියන් වූ

ගෞරවණීය **මහාමායා බාලිකා විද්‍යාලයේ ගුරු මහත්ම මහත්මීන්ට,**

මේ මගේ පළමු E කතා පොත

කෘතවේදීත්වයෙන්, ආදරයෙන් පුද කරමි.

**6 ශ්‍රේණිය D**

**මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව.

2026.05.10

2026.05.10

ලස්සන පුංචි ගෙවත්තක රෝසි, ජෙස්මි, සනී, බෙලා, වයලට් කියන මල් පස් දෙනා සතුටින් හිටියා.

එක දවසක් ගෙවත්තට අලුත් මලක් ආවා. එයාගේ නම ලිලී.



ලිලී ගොඩක් ලස්සනයි. සුදු පාට පෙති, රන්වන් මැද, සුවඳත් හරිම සුවඳයි.

සියලුම මී මැස්සොත් සමනල්ලුත් ලිලී වටේ රොක් වුණා.



රෝසිට හිතුනා "මම  තමයි ලස්සනම කියලා හැමෝම කිව්වේ. දැන් හැමෝම ලිලී දිහා බලනවා".

ජෙස්මිටත්, සනීටත්, බෙලාටත්, වයලට්ටත් එහෙම හිතුනා.

ඔවුන්ට ලිලී ගැන ඊර්ශියාවක් ඇති වුණා.



හැබැයි ලිලී කවදාවත් උඩඟු වුණේ නෑ.

වැස්සට රෝසිගේ පෙති නවෙද්දි ලිලී ඇවිත් එයාට සෙවණ දුන්නා.

"අඬන්න එපා රෝසි, මම ඉන්නවා" කිව්වා.



ජෙස්මිට හුළඟට අඩු නැමුණා. ලිලී ඇවිත් එයාව හරි කරලා බැන්දා.

සනීට අව්ව වැඩි වෙලා පිපාස හිතුනාම ලිලී එයාට තමන්ගේ සෙවණ බෙදා දුන්නා.



බෙලා වැටුණාම ලිලී ඇවිත් එයාව උස්සලා හිටෙව්වා.

වයලට් තනියම වෙලා දුක් වෙද්දි ලිලී ගිහින් කතා කරලා හිනස්සෙව්වා.

ලිලී හැමෝටම උදවු කළා.



කාලය ගියා. එක දවසක් ලිලී හොඳටම රෝගී වුණා.

ඇයට තවත් පිපෙන්න බැරි වුණා.

හැමෝම ලිලී වටේට ඇවිත් "ඇයි අපි ඔයාට ඊර්ෂියා කළේ?" කියලා ඇඬුවා.



රෝසි කිව්වා "ලිලී, අපිට තේරුණා. ලස්සන වෙන්න වඩා වැදගත් හොඳ හිත තියෙන එක කියලා". ජෙස්මි කිව්වා "ඔයා නැතිව අපේ උද්‍යානය අඳුරුයි". සනී, බෙලා, වයලට් හැමෝම එකඟ වුණා.



හැමෝගෙම ආදරේට ලිලීට ආයෙත් ශක්තිය ආවා.

ඇය සෙමෙන් සෙමෙන් හොඳ වුණා.

ඒ දවසේ ඉඳලා උද්‍යානයේ හැම මලක්ම එකට උදවු කරගෙන ජීවත් වුණා.



ඉතින් පුංචි යාළුවනේ, මතක තියාගන්න.

ලස්සනට වඩා වැදගත් කරුණාව.

ඊර් ෂියා කරනවට වඩා උදවු කරන එක තමයි ඇත්තටම ලස්සන.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්යය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)